සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
Islamic Civilization I

47 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- ✻ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✻ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✻ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ඉස්ලාම් ශිෂ්ටාචාරයේ පදනම නිරූපණය වන කාණ්ඩය තෝරන්න.
(1) ඉබාදත්, ඉමාරත්, කිලාෆත්
(2) තව්හීද්, රිසාලත්, මආද්
(3) ඉස්මත්, ඉමාමත්, විලායත්
(4) වරාසත්, වක්ෆු, සදකා
(5) විලායත්, තස්කියත්, හකීකත්

**2.** අරාබි බස, රාජ්‍ය බසක් ලෙස ප්‍රකාශයට පත් කළ පාලකයා,
(1) කලීෆා උමර් (රලි) ය.
(2) කලීෆා මුආවියා (රලි) ය.
(3) කලීෆා අබ්දුල් මලික් ය.
(4) කලීෆා හාරූන් ය.
(5) කලීෆා මඃමූන් ය.

**3.** කියාස්හි මූලිකාංගවල **ෆර්උ** යන්නෙහි අර්ථය කුමක් ද?
(1) විනිශ්චය
(2) පොදු සාධක
(3) සැසඳීම
(4) ඒකමතික තීරණය
(5) අලුත් දෙයක්

**4.** 'ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය-වසර 1000 ක සංහිඳියාව' යන ග්‍රන්ථය රචනා කළේ,
(1) ආචාර්ය ලෝර්නා දේවරාජා ය.
(2) මහාචාර්ය සිරිමා කිරිබමුණේ ය.
(3) ආචාර්ය එම්. ඒ. එම් ෂුක්රි ය.
(4) අයි. එල්. එම්. ඒ. අසීස් ය.
(5) වාන්සන්ඩේන් ය.

**5.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වරණය තෝරන්න.
(1) ඉමාම් අබුල්හසන් අෂ්ෂාදුලි (රහ්) උයෙනාහි අභාවයට පත්වූහ.
(2) මද්රසතුල් බාරි නැගෙනහිර පළාතේ පිහිටා ඇත.
(3) 'හුජ්ජතුල්ලාහ් අල්-බාලිආ' යන ග්‍රන්ථය ඉමාම් ෂාහ්-වලියුල්ලාහ් (රහ්) තුමා විසින් ලියන ලද්දකි.
(4) තජ්මහල්, ඖරංගසීජ් රජු විසින් ආග්‍රාහි ඉදිකරන ලදී.
(5) "වැරදිකරු කවුරු වුවත් දඬුවම් දෙනු ලැබේ" යන්න අකබා සම්මුතියෙහි කොන්දේසි අතුරෙන් එකකි.

**6.** **සිෆ්ෆීන්** යුද්ධය කුමන කලීෆා පාලන සමයේ සිදු වී ද?
(1) කලීෆා අබූ බකර් (රලි)
(2) කලීෆා උමර් (රලි)
(3) කලීෆා උස්මාන් (රලි)
(4) කලීෆා අලි (රලි)
(5) කලීෆා මුආවියා (රලි)

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

7. පහත වගුවේ **X** තීරුවෙන් කතෘවරුන් ද **Y** තීරුවෙන් ඔවුන් විසින් ලියූ ග්‍රන්ථවල නම් ද අනුපිළිවෙළින් තොරව දක්වා ඇත.

| X | Y |
|---|---|
| i. ඉමාම් අබුලයිස් සමර්කන්දි | A - අල් ෆහ්රුල් මුහීද් |
| ii. ඉමාම් ෂාෆිඊ | B - අල් උම්මු |
| iii. ඉමාම් ෆක්රුදීන් අර්-රාසි | C - මෆාතිකුල් කයිබ් |
| iv. ඉමාම් ආලුසි | D - රූහුල් මආනි |
| v. ඉමාම් අබූ හෙයා | E - බහ්රුල් උලූම් |

ඉහත **X** තීරුවේ සඳහන් කතෘවරුන්ගේ අනුපිළිවෙළට අනුව **Y** තීරුවේ සඳහන් ග්‍රන්ථවල නම් පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

(1) B C D E A (2) B E C D A (3) E B C A D (4) E B C D A (5) E C B D A

8. **දීනේ ඉලාහි** යන චින්තනය හඳුන්වා දුන් ඉන්දියානු මුස්ලිම් පාලකයා,
(1) අක්බර් රජු ය. (2) ඖරංගසීබ් රජු ය.
(3) සිරාජ් බහදූර් ෂාහ් රජු ය. (4) ෂාජහාන් රජු ය.
(5) සුල්තාන් මුහම්මද් ගෝරි ය.

9. පහත ප්‍රකාශයන් අතුරෙන් හදීස් සම්බන්ධ ඉස්ලාම් දර්ශනය හා **ප්‍රතිවිරුද්ධ** අදහස් දරණ ප්‍රකාශය තෝරන්න.
(1) නබි (සල්) තුමාගේ අභාවයෙන් පසු හදීස් අවසන් වී ඇත.
(2) හදීස් සියල්ල එකම මට්ටමේ පවතී.
(3) මුතවාතිර් සහ ආහාද් හදීස් යන ඒවා අතුරෙන් මුතවාතිර් වූ හදීස් ප්‍රබල සාක්ෂි වේ.
(4) ඉමාම් බුහාරි, ඉමාම් මුස්ලිම් යන දෙදෙනා විසින් ඇනුම් දුන් හදීස් පමණක් 'මුත්තපකුන් අලෛහි' යනුවෙන් හඳුන්වනු ලැබේ.
(5) හදීස්වල විශ්වසනීය බව ස්ථාපිත කිරීමේ දී 'අස්මා උර්රිජාල්' හි දායකත්වය ඉතා අගනේ ය.

10. "මහා පාපයක් සිදු කළ කිසිවකුටත් නබිතුමාගේ ෂෆාඅත් ලබා ගත නොහැකි ය." යන අදහස ඉදිරිපත් කළ පාර්ශ්වය,
(1) අල් - අෂ් අරියියා ය. (2) අල් - මුර්ජිආ ය.
(3) අල් - මුඃතසිලා ය. (4) අල් - ජබරියියා ය.
(5) අල් කවාරිජ් ය.

11. පහත සඳහන් කරුණු අතුරෙන් **තෆ්සීර් සහ හදීස්** කලාවන් හා සම්බන්ධ වනුයේ,
(1) සබබුන් නුසුල් ය. (2) අල් මුහ්කම් වල් මුතසාබිහ් ය. (3) මක්කි-මදනි ය.
(4) සබබුල් වුරුද් ය. (5) අන්නාසික් වල් මන්සුක් ය.

12. අල්-කුර්ආන්හි පළමු වාක්‍ය නබි තුමා වෙත පහළ වූ නිවැරදි අනුපිළිවෙළ කුමක්ද?
(1) ලව්හුල් මහ්ෆූල් ⟶ බෛතුල් ඉස්සා ⟶ ජිබ්රයිල් (අලෛ) ⟶ හිරා ගුහාව
(2) ලව්හුල් මහ්ෆූල් ⟶ බෛතුල් ඉස්සා ⟶ ජිබ්රයිල් (අලෛ) ⟶ සව්ර් ගුහාව
(3) බෛතුල් ඉස්සා ⟶ ලව්හුල් මහ්ෆූල් ⟶ ජිබ්රයිල් (අලෛ) ⟶ හිරා ගුහාව
(4) බෛතුල් ඉස්සා ⟶ ලව්හුල් මහ්ෆූල් ⟶ ජිබ්රයිල් (අලෛ) ⟶ සව්ර් ගුහාව
(5) ජිබ්රයිල් (අලෛ) ⟶ බෛතුල් ඉස්සා ⟶ ලව්හුල් මහ්ෆූල් ⟶ සව්ර් ගුහාව

13. කුර්තුබා මස්ජිද්හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ තැනැත්තා
(1) පළමුවන අබ්දුර් රහ්මාන් ය. (2) දෙවන අබ්දුර් රහ්මාන් ය.
(3) කලීෆා හිෂාම් ය. (4) කලීෆා දෙවන හිෂාම් ය.
(5) තුන්වන අබ්දුර් රහ්මාන් ය.

14. ස්පාඤ්ඤය, සිරියාව, ඊජිප්තුව යන රටවල් හැඳින්වීමට ඉස්ලාම් ඉතිහාසයේ යෙදූ අරාබි නම් පිළිවෙළින්,
(1) අල්මඃරිබ්, කුද්ස් සහ මිස්ර් ය. (2) සන්කීත්, අප්‍රිකා සහ හබෂා ය.
(3) අන්තලූස්, රූම් සහ බුරූස් ය. (4) අන්දලූස්, ෂාම් සහ මිස්ර් ය.
(5) අල්-හින්ද්, අල්මඃරිබ් සහ අන්දලූස් ය.

15. කලීෆා හාරූන්ගේ පාලන සමයේ ප්‍රබලව සිට ඔහුගේ පාලන කාලය තුළදීම ඔහු අතින් විනාශයට පත් වූ කණ්ඩායම වන්නේ,
(1) අහ්ලුල් බෛත්වරුන් ය. (2) බර්මකින්වරුන් ය. (3) පර්සියානුවන් ය.
(4) මුඃතසිලාවරුන් ය. (5) කාරිජ්වරු ය.

[ තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**16.** අල්-කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමට උස්මාන් (රලි) තුමා විසින් පත් කරන ලද කණ්ඩායමේ සාමාජිකයකු වන්නේ,
(1) උබෛ බින් කඅබ් (රලි) ය. (2) අබූ කුබෛසා (රලි) ය. (3) අබූ දර්දා (රලි) ය.
(4) හුදෛබතුල් යමානි (රලි) ය. (5) සඊද් බින් ආස් (රලි) ය.

**17.** පහත පුද්ගලයන් අතුරෙන් ඉතිහාස ක්ෂේත්‍රයට සේවාවක් කළ විද්වතා
(1) අල් ෆතානි ය. (2) උමර් ඛෛයාම් ය. (3) මාෂා අල්ලාහ් ය.
(4) අල්-කින්දි ය. (5) අලි බින් සීනා ය.

**18.** පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
A - අරාබිවරු දුරස්ථ කිරීම
B - තුර්කිවරුන්ගේ බලපෑම
C - කුඩා රාජ්‍යයන්ගේ බිහිවීම
D - බෛතුල්මාල් අවභාවිතය
E - අනුප්‍රාප්තිකයන්ගේ විනය නොමැතිකම
F - කර්බලා සිද්ධිය
G - අහ්ලුල් බෛත්වරුන්ට රාජ්‍ය පාලනය හිමිකම
ඉහත කරුණු අතුරෙන් අබ්බාසිවරුන්ගේ බිඳවැටීමට හේතු වූ කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A, C, E (2) A, E, F (3) B, C, F (4) B, D, G (5) E, F, G

**19.** මහනුවර රාජධානියේ පරිපාලන ව්‍යුහය තුළ මුස්ලිම්වරු සේවය කළ **මඩිගේ බද්ද** යන පදය නියෝජනය කරන දෙපාර්තමේන්තුව කුමක් ද?
(1) මුළුතැන්ගෙය (2) ආරක්ෂක (3) වෛද්‍ය
(4) සතුන් නඩත්තු කිරීම (5) මත්ස්‍ය කර්මාන්තය සහ ප්‍රවාහන

**20.** පහත වගුවේ **X** තීරුවෙන් ඉස්ලාම් ප්‍රතිසංස්කරණයක් හා සම්බන්ධ පුද්ගලයන් කිහිප දෙනෙකුගේ නම් සහ **Y** තීරුවේ එම පුද්ගලයන් හා ආසන්නව සම්බන්ධ වන සිද්ධීන් දක්වා ඇත. නමුත් ඒවා දැක්වෙන්නේ අනුපිළිවෙළින් නොවේ.

| X | Y |
|---|---|
| i. මෞදූදි (රහ්) | A - ඉඛ්වානුල් මුස්ලිමීන් |
| ii. ඉල්යාස් (රහ්) | B - දීනේ ඉලාහි ප්‍රතික්ෂේප කිරීම |
| iii. අහමද් සිර්හින්ද් (රහ්) | C - උපෙයනා |
| iv. හසනුල් බන්නා (රහ්) | D - තර්ජුමානුල් කුර්ආන් |
| v. අබ්දුල් වහ්හාබ් (රහ්) | E - කාන්දලා |

ඉහත **X** තීරුවට අනුව **Y** තීරුවේ සඳහන් කරුණු පෙළගැස්වූ පිළිතුර තෝරන්න.
(1) A B C D E (2) B D A C E (3) B D E A C
(4) D B A E C (5) D E B A C

**21.** **තව්හීද් උලූහියියා** යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
(1) සියලු මැවීම්වල මැවුම්කරු අල්ලාහ් වේ.
(2) අදහමින් අනුගමනය කිරීමට සුදුසුවන්නා අල්ලාහ් වේ.
(3) අල්ලාහ්ගේ නාම සහ ගුණාංග වේ.
(4) සර්ව ලෝක පාලන බලයන් සියල්ල අල්ලාහ්ට අයත් ය.
(5) අදෘශ්‍යමාන දේ කෙරෙහි විශ්වාසය තැබීම වේ.

**22.** පහත සඳහන් දේ අතුරෙන් **දාරුල් හික්මා** පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) උමයියා සමයේ ආරම්භ කරන ලද පර්යේෂණ ආයතනය ය.
(2) සෙල්ජුක්වරුන් විසින් සංවර්ධනය කරන ලද පර්යේෂණ ආයතනය ය.
(3) කුරුස යුද්ධයේ දී විනාශ කර දැමූ පර්යේෂණ ආයතනය ය.
(4) කලීෆා මඃමූන්ගේ නිරීක්ෂණය යටතේ ගොඩනගන ලද පර්යේෂණ ආයතනය ය.
(5) ෆාතිමීන්වරුන් විසින් බිහිකරන ලද පර්යේෂණ ආයතනය ය.

**23.** ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා සහ ඉමාම් ෂාහ් වලියුල්ලා (රහ්) තුමා විසින් ලියන ලද ග්‍රන්ථ පිළිවෙළින්
(1) අල්-උම්මු සහ අල්-ඉත්කාන් වේ. (2) අර් රිසාලා සහ හුජ්ජතුල්ලාහ් අල්- බාලිආ වේ.
(3) ෆික්හුල් අක්බර් සහ මුඅත්තා වේ. (4) මුස්නද් අහමද් සහ ජාමිඋල් බයාන් වේ.
(5) ෆික්හුල් අක්බර් සහ බිදායතුල් හිදායා වේ.



Department of Examinations Sri Lanka

**24.** ඉස්ලාම් ඉතිහාසයේ පළමු **මුජද්දිද්** ලෙස හඳුන්වන්නේ,

(1) ඉමාම් ෂාෆිඊ (රහ්) ය. (2) ඉමාම් අහමද් බින් හන්බල් (රහ්) ය.
(3) ඉමාම් ගස්සාලි (රහ්) ය. (4) කලීෆා උමර් බින් අබ්දුල් අසීස් (රහ්) ය.
(5) ඉමාම් අබ්දුල් කාදිර් ජීලානි (රහ්) ය.

**25.** **අඉම්මතුල් හුදා** යන නමින් සූෆිවරුන් ප්‍රශංසාවට ලක් කළ ඉමාම් වන්නේ,

(1) ඉමාම් ගස්සාලි (රහ්) ය. (2) ඉමාම් අබ්දුල් කාදර් (රහ්) ය.
(3) ඉමාම් ඉබ්නු තෛමියා (රහ්) ය. (4) ඉමාම් ෂාහ්-වලියුල්ලාහ් (රහ්) ය.
(5) ඉමාම් ෆුලෛල් බින් ඉයාල් (රහ්) ය.

**26.** **අයියාමුල් අරබ්** යන්නෙහි අර්ථය කුමක් ද?

(1) යුද්ධ පැවති දින (2) උත්සව දින (3) ශෝක දින
(4) හජ් සමය (5) සාමය පැවති දින

**27.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) තාරික් බින් සියාද් යන හමුදාපතිගේ නායකත්වයෙන් සින්ද් අත්පත් කරගන්නා ලදී.
(2) නබි ඉබ්රාහීම් (අලෛ) තුමා විසින් මස්ජිදුල් අක්සා ඉදිකරන ලදී.
(3) zසාතුත් නිතාකෙන් යන අන්වර්ථ නාමය හිමිවන්නා අස්මා බින්ද් අබ්බක්කර් (රලි) වේ.
(4) කලීෆා උමර් (රලි) සමයේ තබූක් සහ කෛබර් යන යුද්ධය සිදු විය.
(5) කලීෆා හකම් සමයේ අල් හම්රා මාලිගය ඉදිකරන ලදී.

**28.** ලෝකය ගෝලාකාරයැයි හඳුනාගෙන එහි වට ප්‍රමාණය ගණනය කිරීමට සමීකරණයක් මුල්වරට හඳුන්වා දුන් මුස්ලිම් විද්වතා,

(1) අල්බිරූනි වේ. (2) අල්හුවාරිස්මි වේ. (3) අල්මුකද්දසි වේ.
(4) මාෂා අල්ලාහ් වේ. (5) අබූ සඊද් අස්-සන්ජරි වේ.

**29.** අරාබි රටේ යුදෙව් ආගම හඳුන්වාදීමට හේතු වූ කණ්ඩායම

(1) නුලෛර්, කුරෛෂ් සහ සකීෆ් ය. (2) නුලෛර්, කුරෛෂ් සහ කුරෛලා ය.
(3) කුරෛෂ්, කෛනුකා සහ සකීෆ් ය. (4) කෛනුකා, සකීෆ් සහ කුරෛෂ් ය.
(5) කුරෛලා, කෛනුකා සහ නුලෛර් ය.

**30.** සූෆි චින්තන මත බිහි වූ අල්-කුර්ආන් විවරණය වන්නේ,

(1) හකාඉකුත් තෆ්සීර් ය. (2) ජාමිඋල් බයාන් ය.
(3) තෆ්සීරුල් කුර්ආනිල් අලීම් ය. (4) තෆ්සීර් අල්-කෂ්ෂාෆ් ය.
(5) අන්වාරුල් කුර්ආන් ය.

**31.** ඉස්ලාම් අධිරාජ්‍යයේ ආරක්ෂාව සඳහා මුලින්ම නාවික හමුදාවක් ස්ථාපිත කළ පුද්ගලයා

(1) කලීෆා මුආවියා (රලි) ය. (2) කලීෆා හාරූන් අල්-රෂීද් ය. (3) කලීෆා මඃමූන් ය.
(4) කලීෆා උස්මාන් (රලි) ය. (5) කලීෆා වලීද් බින් අබ්දුල් මලික් ය.

**32.** **සින්දීක්වරු** කවරහුද?

(1) හදීස් දැනුම් දෙන්නන් (2) ඉස්ලාම් විරුද්ධවාදීන් (3) හනීෆ්වරු
(4) බයිසන්තියර්වරු (5) අදේවවාදීන්

**33.** පහත සඳහන් වනුයේ ශිෂ්ටාචාරයන් හා සම්බන්ධ වූ ප්‍රකාශ කිහිපයකි.

A - මෙසපොතේමියානු ශිෂ්ටාචාරය, ඉරාකයේ බැබිලෝනියාව අගනුවර කොට ගෙන තිබුණි.
B - ෆිරඅවුන්ගේ පාලනය පැවති ඊජිප්තුවේ රජවරු දේව පරම්පරාවෙන් පැමිණි බව විශ්වාස කළහ.
C - මෙලොව හා පරලොව ජයග්‍රහණය පිණිස මඟපෙන්වීම ඉස්ලාම් ශිෂ්ටාචාරයෙහි අන්තර්ගත ය.
D - රෝම ශිෂ්ටාචාරයේ අධ්‍යාපන ක්ෂේත්‍රයට දායකත්වය ඉටු කළ පුද්ගලයින් ලෙස සොක්‍රටීස්, ඇරිස්ටෝටල් හා ප්ලේටෝ සැලකේ.
E - සිල්වෙස්ටර් II වැනි පාප්තුමා ස්පාඤ්ඤයේ රැඳී සිට ඉස්ලාම් ශිෂ්ටාචාරය සම්බන්ධව අධ්‍යයනය කොට තම රටට ආපසු සම්ප්‍රාප්තවීමෙන් පසු ඒවා තම ජනයා අතරට ඉදිරිපත් කළ පසු ජනයා විසින් සතුටින් පිළිගත්හ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?/කුමන ඒවා ද?

(1) C ය. (2) E ය. (3) B සහ D ය.
(4) A, B සහ E ය. (5) A, C සහ E ය.



Department of Examinations Sri Lanka

**34.** ජනරජය සහ රජවරුන්ගේ පාලනය හැඳින්වීමට භාවිත වන අරාබි පද පිළිවෙළින්
(1) මුල්කියියත් සහ නුබුව්වත් ය. (2) කිලාෆත් සහ රිසාලත් ය.
(3) මුල්කියියත් සහ කිලාෆත් ය. (4) නුබුව්වත් සහ රිසාලත් ය.
(5) කිලාෆත් සහ මුල්කියියත් ය.

**35.** හුදෙයිබියා සම්මුතිය ලිවීමට නබිතුමා විසින් වගකීම පැවරූ පුද්ගලයා වන්නේ,
(1) අම්රිබ්නුල් ආස් (රලි) ය. (2) මුආවියා බින් අබී සුෆ්යාන් (රලි) ය.
(3) සෙද් බින් සාබිත් (රලි) ය. (4) මආද් බින් ජබල් (රලි) ය.
(5) අලිබින් අබි තාලිබ් (රලි) ය.

**36.** නබි (සල්) තුමා විසින් හබසාවලට යැවූ දූත පිරිසට නායකත්වය දැරූ පුද්ගලයා හා අකබා සම්මුතියෙන් පසු මදීනාවලට ඉස්ලාම් ඉගැන්වීමට යැවූ පුද්ගලයා වන්නේ පිළිවෙළින්,
(1) අලිබින් අබි තාලිබ් (රලි) සහ අම්රිබ්නුල් ආස් (රලි) වේ.
(2) ජඃෆර් බින් අබිතාලිබ් (රලි) සහ මුස්අබ් බින් උමෛර් (රලි) වේ.
(3) ජඃෆර් බින් අබිතාලිබ් (රලි) සහ සයිද් බින් සාබිත් (රලි) වේ.
(4) මුස්අබ් බින් උමෛර් (රලි) සහ අම්රිබ්නුල් ආස් (රලි) වේ.
(5) උස්මාන් බින් අෆ්ෆාන් (රලි) සහ සඃද් බින් අබි වක්කාස් (රලි) වේ.

**37.** පහත සඳහන් වන්නේ මුස්ලිම්වරුන් අතර ව්‍යවහාරයේ පවතින ඇතැම් වචන වේ.

A - අව්රාදු E - ඉස්මත්
B - මෂූරා F - කරාමත්
C - ෂෙයිකු G - ෂහාදත්
D - zසික්රු H - වරාසත්

මේවායින් සූෆිවරුන් හා සම්බන්ධ වචන ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A, B, F, G (2) A, C, D, F (3) B, E, G, H
(4) B, E, F, H (5) E, F, G, H

**38.** ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍යය සහ තුර්කියේ උස්මාන් කිලාෆතය බිඳවැටුණු වර්ෂ පිළිවෙළින්,
(1) ක්‍රි.ව. 1857 සහ ක්‍රි.ව. 1924 වේ. (2) ක්‍රි.ව. 1258 සහ ක්‍රි.ව. 1857 වේ.
(3) ක්‍රි.ව. 1099 සහ ක්‍රි.ව. 1924 වේ. (4) ක්‍රි.ව. 1492 සහ ක්‍රි.ව. 1857 වේ.
(5) ක්‍රි.ව. 1099 සහ ක්‍රි.ව. 1492 වේ.

**39.** **කාලිත් බින් බකායා** නම් වූ ශිලා ලේඛනය ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයේ මුස්ලිම්වරු පදිංචි වී සිටි බවට මූලාශ්‍රය වන්නේ ද?
(1) වැලිගම (2) කොළඹ (3) බේරුවල (4) පුත්තලම (5) ත්‍රිකුණාමලය

**40.** පහත වගුවේ **X** තීරුවෙන් හදීස් ක්ෂේත්‍රයට සම්බන්ධ වූ ඉමාම්වරුන්ගේ නම් ද **Y** තීරුවෙන් ඔවුන් ජනයා අතර ප්‍රචලිතව සිටි අන්වර්ථ නාමයන් ද අනුපිළිවෙළින් තොරව දක්වා ඇත.

| X | Y |
|---|---|
| i. මුහම්මදු ඉබ්නු ඉස්මයිල් | A - අන්නසායි |
| ii. මුස්ලිම් බින් හජ්ජාජ් | B - අබුදාවුද් |
| iii. සුලෛමාන් බින් අස්අස් | C - තිර්මිදි |
| iv. මුහම්මද් බින් ඊසා | D - මුස්ලිම් |
| v. අබු අබ්දුල් රහ්මාන් අහ්මද් බින් සුඅයිබ් | E - බුහාරි |

X තීරුවේ සඳහන් තොරතුරුවලට අනුව, Y තීරුවේ සඳහන් තොරතුරු අනුපිළිවෙළින් පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි වරණය තෝරන්න.
(1) A C D E B (2) A C B E D (3) A D E C B
(4) E B A C D (5) E D B C A

**41.** **මුඉස්සුත් තෞලා** යන අන්වර්ථ නමින් හැඳින් වූ පාලකයින් නියෝජනය කළ කුඩා රාජ්‍යය වන්නේ,
(1) ඉුවයිද්වරුන් ය. (2) සෆව්වරුන් ය. (3) සෙල්ජුක්වරු ය.
(4) ෆාතිමීන්වරු ය. (5) අයියුබිවරු ය.

**42.** මාප්පිල්ලෙ ලෙබ්බෙ ආලිම්තුමා විසින් ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත කළ තරීකාව වන්නේ,
(1) ෂාදුලියියා ය. (2) නක්ෂබන්දියා ය. (3) කාදිරියියා ය.
(4) රිෆාඉය්යා ය. (5) නබවියියා ය.

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**43.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - විද්‍යා ක්ෂේත්‍රයේ යුරෝපීයන්ගේ නැගීමට හේතු වූයේ ස්පාඤ්ඤ මුස්ලිම්වරුන් ය.

B - දේශ ගවේෂක වස්කෝ ද ගාමාට ඉන්දියාවට පැමිණීමට මග පෙන්වූයේ ඉබ්නු මජිද් වේ.

C - ස්කැන්ඩ්රියාවේ පිහිටි කාලගුණ පරීක්ෂණ මධ්‍යස්ථානය ලෝකයේ පිහිටුවන ලද පළමුවන කාලගුණ පරීක්ෂණ මධ්‍යස්ථානය වේ.

D - මන්ජනික්, තබාබා වැනි යුද උපකරණ පළමුව හඳුන්වා දුන්නේ මුස්ලිම්වරුන් ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමන ඒවා ද?

(1) A සහ B ය. (2) B සහ C ය. (3) C සහ D ය.
(4) A, B සහ C ය. (5) B, C සහ D ය.

**44.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඉස්ලාම් ශිෂ්ටාචාරය පරලොව ජයග්‍රහණ ඉලක්ක කර සැකසී ඇත.
(2) අල්-කුර්ආන්වලට මුස්ලිම්වරයෙකුගේ පළමු යුතුකම වන්නේ එය පාරායනය කිරීම පමණක් ය.
(3) 'ඉස්රායිලියියාත්' යනු තෆ්සීර් සමග ඇතුළත් කළ ප්‍රබන්ධ කථා ලෙස සැළකේ.
(4) මිනිස් ජීවිතයට මගපෙන්වීමට මිනිස් බුද්ධිය පමණක් ප්‍රමාණවත් වේ.
(5) "ජාමිඋල් කුර්ආන්" යන අන්වර්ථ නාමය සයිද්බින් සාබිත් (රලි) ට හිමි වේ.

**45.** **අජා ඉබුල් හින්ද්** යන ග්‍රන්ථයෙහි ශ්‍රී ලංකාව ගැන සඳහන් කරුණු මොනවා ද?

(1) නබිතුමාගේ සමයේ සිටම ශ්‍රී ලංකාවේ හාසිම්වරුන් ජීවත්ව සිටියහ
(2) ශ්‍රී ලංකාවේ රජු විසින් කලීෆා වලීද් බින් අබ්දුල් මලික් වෙත යවන ලද තෑගි භාණ්ඩ ඉන්දීය රජ කෙනෙකු මංකොල්ල කෑම, සින්දි හමුදා මෙහෙයුමට හේතු විය.
(3) වහබ් බින් අබි හබ්ෂා යන සහාබිවරයා චීනයට යන අතරමග දී ශ්‍රී ලංකාවේ රැඳී සිටියේ ය.
(4) ඉස්ලාම් ගැන දැනගෙන පැමිණෙන ලෙස අග්‍රබෝධි රජු විසින් නබිතුමා වෙත දූතයෙක් යවනු ලැබී ය.
(5) පොළොන්නරුව රාජධානියේ මුස්ලිම්වරු කිහිප දෙනෙකු රජුගේ උපදේශකයන් ලෙස කටයුතු කළ හ.

- අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| **වරණ අංකය** | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | නිවැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැනි ප්‍රකාශය** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **46.** | ඉජ්තිහාද්, නබිතුමාගේ කාලවකවානුවේ සිටම භාවිතයේ පැවතියේ ය. | ඉමාම් හුසෛයින් (රලි) තුමා කිලාෆත් නායකත්වය අතහැරීමෙන් පසු මුආවියා (රලි) තුමාට කිලාෆත් නායකත්වය ලැබුණේ ය. |
| **47.** | ඉඛ්වානුල් මුස්ලිමින්, ඉන්දීය අර්ධද්වීපයේ බිහි වූ ඉස්ලාම් දෑවා සංවිධානයකි. | බුවෛද්වරුන්ගේ සමයේ මද්රසා නිලාමියා බිහි විය. |
| **48.** | වස්තුහිමි යන තැනැත්තා ශ්‍රී ලංකා ඉතිහාසයේ සඳහන් මුස්ලිම් පාලකවරුන්ගෙන් කෙනෙකි. | මස්ජිද්වල මිහ්රාබ් යනු කිබ්ලා දිශාව පෙන්වන සංකේතයකි. |
| **49.** | ෆික්හු ක්ෂේත්‍රයේ මද්හබ් බිහිවූවා සේ තසව්වුෆ් ක්ෂේත්‍රයේ තරීකා බිහිවීම සිදු විය. | කාදියානි යන්නෙන් හඳුන්වන අය මුසෛලමා යන ව්‍යාජ නබිගේ පරම්පරාවේ අය ය. |
| **50.** | සහාබිවරුන්ගේ සමයේ අල්-කුර්ආන්වලින් පමණක් ඉජ්තිහාද් සිදු කරන ලද බව කීම අසත්‍යයකි. | නබිවරුන් හා රසූල්වරුන්ගේ පැමිණීම අවසන් වූ ලෙසම මුජ්තහිද්වරුන්ගේ පැමිණීම ද අවසන් වී ඇත. |

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) ඉස්ලාම් ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණ සඳහන් කරන්න.

(ii) අනෙකුත් ශිෂ්ටාචාර හා මිශ්‍රවීම නිසා ඉස්ලාම් ලෝකයේ ඇතිවී තිබෙන හානිදායක බලපෑම් ගැන පැහැදිලි කරන්න.

(iii) මධ්‍යගත යුගයේ මුස්ලිම් ලෝකයේ සහ යුරෝපීය රටවල අධ්‍යාපන තත්ත්වය කෙසේ පැවැතියේදැයි විස්තර කරන්න.

(iv) මුස්ලිම්වරු භූගෝල විද්‍යා ක්ෂේත්‍රයේ නියැළීමට තුඩුදුන් හේතු පරීක්ෂා කරන්න.

(v) මුස්ලිම් වෛද්‍ය විද්‍යාඥයකු වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයට සිදු කළ දායකත්වය අගය කරන්න.

**2.** (i) තව්හීද් හි ප්‍රධාන බෙදීම් **දෙක** සහ එහි අන්තර්ගත ප්‍රධාන කොටස් **තුන** සඳහන් කරන්න.

(ii) සුන්නාහි වැදගත්කම අල්-කුර්ආන් සාක්ෂි සමග විස්තර කරන්න.

(iii) ඉස්ලාම් නීතිය තැනීමේ දී ද්විතීය මූලාශ්‍ර අවශ්‍ය වීමට හේතු සඳහන් කරන්න.

(iv) මුස්ලිම්වරුන් අතර බිහිවූ ආගමික කණ්ඩායම්වලින් ඔවුනට ඇති වූ අයහපත් බලපෑම් **හතරක්** විස්තර කරන්න.

(v) ඉමාම් ෂාෆිඊ (රහ්) තුමා ෆික්හු ක්ෂේත්‍රයට සිදු කළ දායකත්වය අගය කරන්න.

**3.** (i) උමෛයා කිලාපත් ස්ථාවර කිරීමට කලීෆා මුආවියා (රලි) තුමාගේ දායකත්වය සාකච්ඡා කරන්න.

(ii) කිලාෆතුර් රාෂිදා හා උමයියා කිලාෆත් අතර දක්නට තිබූ පරිපාලන වෙනස්කම් ලැයිස්තු ගත කරන්න.

(iii) කලීෆා අබ්දුල් මලික් තම පාලන කාලය තුළ මුහුණදුන් බහුවිධ අභියෝග විස්තර කරන්න.

(iv) කලීෆා අබූ ජඃෆර් අල් මන්සූර්ගේ සේවාව අගය කරන්න.

(v) අබ්බාසි කිලාෆත්ති බිඳවැටීමට මග පෑදූ සාධක පරීක්ෂා කරන්න.

## II කොටස

**4.** (i) මදීනා ශාසනයේ ප්‍රධාන කොන්දේසි සඳහන් කොට ඒවා අතුරෙන් ආගමික සංහිඳියාව පෙන්වන කොන්දේසි පැහැදිලි කරන්න.

(ii) කිලාෆත් පාලනය සහ බටහිර ප්‍රජාතන්ත්‍රවාදී පාලනය අතර දැකිය හැකි සමානතා හා අසමානතා ලැයිස්තු ගත කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

5. (i) ඉස්ලාමීහි ආරම්භක ශත වර්ෂයේ දී ශ්‍රී ලංකාවට ඉස්ලාමය හඳුන්වාදීම පිළිබඳ පැහැදිලි කරන්න.
   (ii) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනයට සිද්දිලෙබ්බෙ විද්වතාගේ දායකත්වය අගය කරන්න.

6. (i) හදීස් ආරක්ෂා කර ගැනීමට නබිතුමාගේ සමයේ ගන්නා ලද ක්‍රියාමාර්ග විස්තර කරන්න.
   (ii) ෆික්හු කලාව බිහිවීමට මඟ පෑදූ කරුණු පැහැදිලි කරන්න.

7. (i) නබිතුමානන්ට අල්-කුර්ආනය කොටස් වශයෙන් පහළ වීමට හේතු **පහක්** විස්තර කරන්න.
   (ii) 'නීති ව්‍යුත්පන්න වීම සඳහා ඉජ්තිහාද් මාර්ගයක් වේ' යන්න අල්-කුර්ආන් සහ අල්-හදීස්හි සාක්ෂි සහිතව විමසන්න.

8. (i) ඉස්ලාම් ශිෂ්ටාචාරය අකර්මන්‍ය වීමට හේතුවූ කරුණු පැහැදිලි කරන්න.
   (ii) 'තජ්දීද්' යන්නෙහි අර්ථය පැහැදිලි කොට, එය ඉස්ලාම් ඉතිහාසයේ ස්වභාවයෙන්ම සිදුවන ක්‍රියාවක්ය යන්න තහවුරු කරන්න.

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka